**ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම - 2021**
**--------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
සමාගමේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 අඛණ්ඩ පැවැත්මට අදාළ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාව

මාගේ මතය තත්ත්වාගණනය කිරීමෙන් තොරව, මූල්‍ය ප්‍රකාශනවල සටහන් 2.1 වෙත අවධානය යොමු කරවමි.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.5 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳාපවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ**

**1.6.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | වටිනාකම (රු.) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ඉන්වෙන්ටරි | 12,141,603 | ඉන්වෙන්ටරි සත්‍යාපන වාර්තා | 2021 දෙසැම්බර් 31 දිනට ඉන්වෙන්ටරි ශේෂය රු. 12,141,603 ක් විය. කෙසේ වුවද, 2021 දෙසැම්බර් 31 දිනට ඉන්වෙන්ටරි සත්‍යාපන වාර්තාව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. කිසිදු මෙහෙයුමක් සිදු නොවූ බැවින්, එකල සිටි විගණකගේ උපදෙස් යටතේ හානිකරණය සඳහා ප්‍රතිපාදන සලසන ලදී. ඉන්වෙන්ටරිවල හානිකරණය රු. 12,141,063 ක් විය.<br>හානිකරණ ගණනය කිරීමක් සිදු කරන ලද අතර 2022.05.26 දින එය ඔබට ලබා දෙන ලදී. හානිකරණය කළ තොගය භාවිත නොකරන නමුත්, එම තොගය අපගේ බණ්ඩාරගම පරිශ්‍රයේ පවතී. | 1) වාර්ෂික තොග සත්‍යාපනය සිදු කළ යුතුය.<br>2) ආයතනයේ සම්පත් උපරිම ප්‍රතිලාභ ලබා ගත හැකි ආකාරයෙන් උපයෝජනය කළ යුතුය. |
| දේපළ, පිරියත සහ උපකරණ | 5,159,044 | ස්ථාවර වත්කම් සත්‍යාපන වාර්තා | 2021 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය රු. 5,159,044 ක් වන අතර මේ සියල්ල 2013 වසරේ සිට නිෂ්ක්‍රීයව පවතී. තවද, 2021 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් සත්‍යාපන වාර්තාව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 1) වාර්ෂික තොග සත්‍යාපනය සිදු කළ යුතුය.<br>2) ආයතනයේ සම්පත් උපරිම ප්‍රතිලාභ ලබා ගත හැකි ආකාරයෙන් උපයෝජනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 328,912 ක පාඩුවක් වූ අතර ඉකුත් වර්දයේ එයට අනුරූප පාඩුව රු. 376,206 ක් විය. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.705,118 ක පිරිහීමක් නිරීක්ෂණය කරන ලදී. මෙම පිරිහීමට ප්‍රධානම හේතුව වන්නේ පරිපාලන වියදම් ඉහළ යාම සහ සමාලෝචිත වර්ෂය සඳහා වෙනත් ආදායමක් නොමැති වීමය.

### 2.2 අනුපාත විශ්ලේෂණය

සමාගමේ ජංගම අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව 0.93 සිට 0.89 දක්වා අඩු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට සමාගමේ කොටස් ප්‍රාග්ධනය රු. 25,001,000 ක් විය. මුළු කොටස් ප්‍රාග්ධනයෙන් රු. 25,000,000 ක මුදලක් ලංකා විදුලි (පුද්ගලික) සමාගම විසින් 2012 වර්ෂයේ දී ආයෝජනය කරන ලද විදුලි කණු නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියට අදාළ වේ. 2013 වර්ෂයේ දී තත්ත්ව පරික්ෂාව සිදු කිරීමට නොහැකි වීම හේතුවෙන් සමාගම මගින් විදුලි කණු නිෂ්පාදනය නතර කළ අතර 2021 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් රු.25,962,616 ක සමුච්චිත පාඩුවක් වාර්තා කර තිබුණි. කෙසේ වුවද, පසුගිය වර්ෂ කිහිපය තුළ සහ සමාලෝචිත වර්ෂය තුළ කිසිදු මෙහෙයුමක් වාර්තා වී නොතිබුණි. තවද, සමාගමේ ව්‍යාපාර සැලැස්ම/ යෝජනාව විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සමාගම විසින් 2008 වර්ෂයේ දී ව්‍යාපාරය ආරම්භ කරන ලදී. 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා සමාගම ලාභ වාර්තා කරන ලදී. එසේ වුවද, යම් තාක්ෂණික දෝෂ හේතුවෙන් කණු නිෂ්පාදනය අසාර්ථක විය. මේ නිසා, 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සමාගම පාඩු ලබන ලදී. 2016 වර්ෂයෙන් පසුව පාඩු සිදුවීම වළක්වා ගැනීම සඳහා කුඩා ව්‍යාපාරික කටයුතු සිදු කිරීමට කළමනාකාරිත්වය තීරණය කළ අතර සමුච්චිත පාඩු අවම කිරීම සඳහා කුඩා රැකියා කිහිපයක් භාර ගන්නා ලදී. කෙසේ වුවද, වර්තමානයේ මෙම සමාගම අස්තිත්වයක් වශයෙන් ව්‍යාපාරික කටයුතු මෙහෙයවීම සඳහා සුළු ලාභයක් ලබා ගන්නා අතර ඉහත තත්ත්ව මත, රු. 25,962,616 ක සමුච්චිත රඳවා ගත් පාඩුවක් සිදු විය. තවද, සමාගම සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය නමින් විශේෂ ව්‍යාපෘතියක් 2022 දී භාර ගන්නා ලද අතර එහි පිරිවැය රු. මිලියන 28.34 ක් වන අතර සමුච්චිත පාඩුව අවම කිරීම සඳහා මෙම ව්‍යාපෘතියෙන් රු. මිලියන 6.5 ක ලාභයක් අපේක්ෂා කරයි. | 1) සංවිධානයේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා විදුලි කණුවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට කටයුතු කළ යුතුය.<br>2) ආයෝජනය නිසි අගයකිරීමක් සහිතව සිදු කළ යුතුය. |

**3.2 නිෂ්ක්‍රීය හෝ ඌනඋපයෝජිත දේපළ, පිරියත සහ උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය රු. 5,159,044 ක් වූ අතර මෙම වත්කම් සියල්ල 2013 වර්ෂයේ සිට නිෂ්ක්‍රිය වී තිබුණි. | අපට මෙහෙයුම් නොමැති බැවින්, මෙම වත්කම් උපයෝජනය නොකෙරේ. එසේ වුවද, මෙම සියලුම වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇත. | සංවිධානයේ සම්පත් උපරිම ප්‍රතිලාභ ලබා ගත හැකි වන පරිදි උපයෝජනය කළ යුතුය. |

**4. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත ගිණුම් විගණකාධිපතිවරයා වෙත ලබා දිය යුතු වුවද, 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 ප්‍රකාරව එම අවශ්‍යතාවයට අනුකූල වීමට සමාගමට නොහැකි වී තිබුණි. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**4.2 වාර්ෂික වාර්තාව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 අනුව, වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම යනු ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ 100% කොටස් හිමිකාරීත්වය සහිත පූර්ණ අනුබද්ධිත ආයතනයකි. එබැවින්, ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශය ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර වාර්ෂික වාර්තාවේ ප්‍රකාශයට පත් කර ඇත. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**4.3 සංස්ථාපිත සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දින නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි අංක 5.1 ඡේදය අනුව, ව්‍යවසායේ අනාගත දිශානතියට අදාළ ක්‍රමෝපාය සංස්ථාපිත සැලැස්මේ ඇතුළත් වන අතර සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූල වීමට අසමත් වී තිබුණි. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම ලැබී නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |